සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය Sakya Academy of Higher Education Sakya Academy of Higher Education

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education

SAP EXAMINATION

සක්‍යා උසස් පෙළ පෙරහුරු විභාගය 2021
**Sakya Advanced Level Preparatory Examination 2021**

**FINAL - 11**

| | | |
|---|---|---|
| **ව්‍යාපාර අධ්‍යයනය I**<br>Business Studies I | **32 S I** | *පැය දෙකයි*<br>*Two Hours* |

**උපදෙස්:**

විභාග අංකය ......................................................

- ❄ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ❄ **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ❄ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.
- ❄ සෑම ප්‍රශ්නයකටම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

- **ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි හෝ ඉතාමත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

01. මෑත කාලයේ ශ්‍රී ලංකා මහ බැංකුව ට්‍රිලියන 2.8 ක පමණ එනම් සමස්ත මුදල් සැපයුමෙන් 42% ක් පමණ නව කාණ්ඩයේ මුදල් නෝට්ටු මහජනයාට සංසරණයට එක්කර ඇති බව ප්‍රකාශ වේ. මෙම ප්‍රකාශය ඇතුළත් කළ හැකි වඩාත් උචිත සාර්ව පරිසර බලවේගය වනුයේ,
(1) ප්‍රජා විද්‍යාත්මක පරිසරයට ය
(2) ගෝලීය පරිසරයට ය
(3) තාක්ෂණික පරිසරයට ය
(4) ආර්ථික පරිසරයට ය
(5) දේශපාලන පරිසරයට ය

02. නිර්මාල් දියර කිරි කම්හලක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර, ඒ සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කරමින් සිටී. මෙහිදී අවශ්‍ය නිෂ්පාදන සාධක සටහන් කිරීමේ දී ප්‍රාග්ධනය ලෙස දැක්විය යුත්තේ,
(1) ණය මුදල්, ලී බඩු උපකරණ, තාක්ෂණය, යන්ත්‍ර සූත්‍ර
(2) ගොඩනැගිලි, බිම් ඉඩකඩ, කාරක ප්‍රාග්ධනය, ණය මුදල්
(3) වත්කම්, වගකීම්, මුදල්, සේවක දැනුම
(4) යන්ත්‍ර සූත්‍ර, මුදල්, ගොඩනැගිලි, උපකරණ
(5) යන්ත්‍ර සූත්‍ර, මුදල්, උපකරණ, ව්‍යාපාර සංවිධාන ක්‍රමය

03. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක කටයුතු සහ ව්‍යාපාර කාර්යන් කිහිපයකි.
A - ව්‍යාපාර කටයුතු සම්බන්ධ ලියකියවිලි පවත්වා ගෙන යාම
B - සේවකයන් පුහුණු කිරීම
C - අවශ්‍යතා හා වුවමනා සපුරාලීම
D - ව්‍යාපාරයේ මුදල් පාලනය කිරීම
E - සම්පත්වලට අගයක් එකතු කිරීම

මේවා අතුරෙන් ව්‍යාපාරයක කටයුතු හා ව්‍යාපාරික කාර්ය අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර වන්නේ,
(1) A,E / B,C,D
(2) A,C / B,D,E
(3) A,B / D,C,E
(4) C,E / A,B,D
(5) C,B / A,D,E

04. "යම්කිසි පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් කුමක් නිවැරදි ද කුමක් වැරදි ද නැතහොත් කුමක් හොඳ ද කුමක් නරක ද යන්න සම්බන්ධයෙන් ලිඛිතව, වාචිකව හෝ ව්‍යාංගයෙන් පැමිණ ඇත්තා වූ පොදු එකඟතා" හැඳින්විය හැක්කේ,
(1) ආචාර ධර්ම සංග්‍රහය ලෙස ය
(2) ව්‍යාපාර ආචාර ධර්ම ලෙස ය
(3) ව්‍යාපාර සමාජ වගකීම ලෙස ය
(4) ව්‍යාපාර නීති හා රීති ලෙස ය
(5) ව්‍යාපාර යහපාලන පිළිවෙත් ලෙස ය

[ දෙවෙනි පිටුව බලන්න

05. සමූපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ වන වගන්ති කිහිපයක් පහත දක් වේ.
A - ස්වාධීන ආත්මාධාර සංවිධානයක් වීම
B - ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
C - සමාජය කෙරෙහි සැලකිලිමත් වීම
D - එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමි වීම
E - ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
F - ලාභය මූලික අරමුණ නොවීම
ඉහත ප්‍රකාශ අතුරෙන් සමූපාකාර ව්‍යාපාරයට පදනම් වූ ලක්‍ෂණ හා සමූපාකාර ප්‍රතිපත්ති වෙන් කර දක්වෙන පිළිතුර වන්නේ,

| | පදනම් වූ ලක්‍ෂණ | ප්‍රතිපත්ති |
|---|---|---|
| (1) | A, E, F | B, C, D |
| (2) | A, B, C | D, E, F |
| (3) | A, D, F | B, C, E |
| (4) | B, C, D | A, E, F |
| (5) | D, E, F | A, B, C |

06. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වෙන් වෙන් ව ව්‍යාපාර කටයුතු කරන සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ඒකකයක් බවට පරිවර්තනය වීම අත්පත් කර ගැනීම ලෙස හඳුන්වයි
(2) ව්‍යාපාර දාමයේ විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම තිරස් සංයෝජනය ලෙස හඳුන්වයි
(3) එක ම ගණයේ ව්‍යාපාරවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම සිරස් සංයෝජනය ලෙස හඳුන්වයි
(4) විවිධ භූගෝලීය ප්‍රදේශවල වෙළෙඳ පොළ කටයුතු කරන සමාගම් එකතු වීම ඒකාබද්ධ වීම ලෙස හඳුන්වයි
(5) විවිධ ව්‍යාපාර දාමයන්හි විවිධ අවස්ථාවන්හි යෙදී සිටින ව්‍යාපාර එකට එකතුවීම විෂම සංයෝජනය ලෙස හඳුන්වයි

07. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් මෙන්ම වෙනස්කම් ද ඇත. ව්‍යවසායකයාට සුවිශේෂී වූ ලක්ෂණ ඇතුළත් වරණය කුමක් ද ?
(1) සහයෝගයෙන් කටයුතු කරයි. අවදානම් භාර ගනියි. ව්‍යාපාරයෙන් ජීවත් වෙයි. පාරිභෝගිකයා ඉලක්ක කොට කටයුතු කරයි
(2) ලාභ අරබයා කටයුතු කරයි. ව්‍යාපාරයෙන් ජීවත් වේ. තරගයට යොමුව කටයුතු කරයි. අවදානම් දරයි
(3) ආරක්ෂාකාරීව කටයුතු කරයි. ව්‍යාපාරයෙන් ජීවත් වෙයි. සහයෝගයෙන් කටයුතු කරයි. ස්වකීය අදහසකට ව්‍යාපාරය අරඹයි
(4) වෙළඳ පොළ නායකයෙකි. පාරිභෝගිකයා ඉලක්ක කොට ගෙන කටයුතු කරයි, අවදානම් දරයි, දෛවයේ තීරකයෙක් සෙවීමට කටයුතු කරයි
(5) ස්වකීය අදහසකට ව්‍යාපාරය අරඹයි. ව්‍යාපාරය සඳහා ජීවත් වේ. අවදානම් භාර ගනියි. වෙළඳ පොළ නායකයෙකි

08. පහත දක්වෙන්නේ ව්‍යාපාර කටයුතුවල යෙදෙන පුද්ගලයන් පිළිබඳ හැඳින්වීම් කිහිපයකි.
ගනිඳු : පියාගෙන් හිමි වූ රෙදි සාප්පුව, කාන්තා, පිරිමි, ළමා ලෙස අංශවලට බෙදා ව්‍යාපාරය පුළුල් කර ඇත
විහඟ : ජාතික අධ්‍යනිකත්ව හා වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලාවෙන් පසු ගරාජයක් ආරම්භ කර ඇත
සඳෙව් : පාරම්පරික ව කෘෂිකර්මාන්තයේ යෙදෙන අතර කාබනික වගාවෙන් ලබා ගන්නා එළවළු, පළතුරු හා පලා වර්ග ක්‍ෂණික ව පරිභෝජනය සඳහා සූදානම් කොට ඉදිරිපත් කරයි
පැතුම් : යක්කල අයුර්වේද විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලැබූ දේශීය වෛද්‍යවරයෙක් වන ඔහු, ආයුර්වේද ක්ෂණික වේදනා නාශකයක් හඳුන්වා දී ඇත.
ඉහත පුද්ගලයින් අතුරෙන්,
(1) ගනිඳු හා සඳෙව් ව්‍යවසායකයෙකු නොවන අතර විහඟ හා පැතුම් ව්‍යවසායකයින් ය
(2) විහඟ හා සඳෙව් ව්‍යවසායකයින් වන අතර ගනිඳු හා පැතුම් ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයින් ය
(3) ගනිඳු හා විහඟ ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයින් වන අතර සඳෙව් හා පැතුම් ව්‍යවසායකයින් ය
(4) පැතුම්, විහඟ හා සඳෙව් ව්‍යවසායකයින් වන අතර ගනිඳු ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයෙකි
(5) පැතුම්, සඳෙව් හා ගනිඳු ව්‍යවසායකයින් වන අතර විහඟ ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයෙකි

[ තුන්වැනි පිටුව බලන්න

09. ව්‍යාපාරවල පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් පහත දක් වේ.
   A - සේවක සංඛ්‍යාව අඩු වීම
   B - බොහෝ විට ප්‍රාග්ධන සූක්ෂම ක්‍රමය භාවිත කිරීම
   C - වෙළඳ පොළ කුඩා වීම
   D - ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම
   E - නිෂ්පාදිත බොහෝ විට දේශීය වෙළඳ පොළ මූලික කොට බිහි වීම
   F - තීරණ ගැනීම සංකීර්ණ වීම
   G - නීතිමය බැඳීම් දැඩි වීම

   මේවායින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අදාළ ලක්ෂණ නිරූපණය වන පිළිතුර තෝරන්න.

   (1) A, B, E, G (2) B, D, E, F (3) C, E, F, G
   (4) A, C, F, G (5) A, C, D, E

10. මිරිස් හා තුනපහ කුඩු නිෂ්පාදන කර බෙදාහැරීම සිදු කරන දික්විජය තමන්ගේ ම ගොඩනැගිල්ලක ව්‍යාපාරය පවත්වා ගෙන යයි. ඔහු මිරිස් හා තුනපහ කුඩු බෙදා හැරීම සඳහා කුලී පදනම මත වෑන් රථ දෙකක් ලබා ගෙන ඇත. ඔහුට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.
   (1) මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය, සමුද්‍රීය රක්ෂණය, ස්වාභාවික විපත් රක්ෂණය, ගිනි රක්ෂණය
   (2) ගිනි රක්ෂණය, සොරබිය රක්ෂණය, මාර්ගස්ථ මුදල් රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
   (3) සමුද්‍රීය රක්ෂණය, මාර්ගස්ථ මුදල් රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය, සොරබිය රක්ෂණය
   (4) මෝටර් රථ රක්ෂණය, සොරබිය රක්ෂණය, ගිනි රක්ෂණය, මාර්ගස්ථ මුදල් රක්ෂණය
   (5) ගිනි රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, සමුද්‍රීය රක්ෂණය, ස්වාභාවික විපත් රක්ෂණය

11. පහත වගුවේ 2020 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් උපුටා ගත් ශ්‍රී ලංකාවේ මූල්‍යායතන වර්ගීකරණයක් සහ ඊට අදාළ නිදසුන් කිහිපයක් වේ.

| මූල්‍යායතන වර්ගීකරණය | නිදසුන් |
|---|---|
| (i) බැංකු අංශය<br>(ii) තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍යායතන<br>(iii) විශේෂිත මූල්‍යායතන<br>(iv) ගිවිසුම්ගත ඉතුරුම් ආයතන | A - ලියාපදිංචි මුදල් සමාගම්<br>B - කොටස් තැරැව්කාර සමාගම්<br>C - බලපත්‍රලාභී වාණිජ බැංකු<br>D - ඒකකභාර කළමනාකරණ සමාගම්<br>E - රක්‍ෂණ සමාගම්<br>F - ශ්‍රී මහ බැංකුව<br>G - සේවක අර්ථ සාධක අරමුදල<br>H - සමූපකාර ග්‍රාමීය බැංකු |

   ඉහත දී ඇති මූල්‍ය ආයතන වර්ගීකරණ අනුපිළිවෙළ අනුව නිදසුන් නිවැරදිව ගලපා ඇති වරණය කුමක් ද ?
   (1) CF / AH / BD / EG (2) AH / CF / BD / EG
   (3) BD / AH / EG / CF (4) CF / AH / EG / BD
   (5) CF / EG / BD / AH

12. ගීනා හා මීනා යෙහෙළියන් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා ම අලිගැටපේර ගෙඩි 50 ක් බැගින් පළතුරු වෙළෙඳ සැලකින් මිලට ගත් අතර ගීනා අලිගැටපේර මිලට ගත්තේ දාන පිංකමක් සඳහා වන අතර මීනා සිය පළතුරු බීමහල මිලට ගත්තා ය. මේ අනුව ගීනා හා මීනා යන දෙදෙනා සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,
   (1) ගීනා හා මීනා යන දෙදෙනාම පාරිභෝගිකයෝ ය
   (2) ගීනා හා මීනා යන දෙදෙනා ම සිල්ලර වෙළෙන්දියන් ය
   (3) ගීනා සිල්ලර වෙළෙන්දෙකි. මීනා පාරිභෝගිකයෙකි
   (4) ගීනා පාරිභෝගිකයෙකි. මීනා සිල්ලර වෙළෙන්දෙකි
   (5) ගීනා හා මීනා යන දෙදෙනා ම වෙළෙඳ නියෝජිතයෝ ය

13. භාණ්ඩ ආනයන ක්‍රියාපටිපාටියට අදාළ පියවර කිහිපයක් පහත දැක් වේ.
- ★ විදේශීය සැපයුම්කරුවකු තෝරා ගැනීම
- ★ මිල විමසුමක් යැවීම
- ★ මිල කියුමක් ලැබීම
- ★ ආනයන බලපත්‍රයක් ලබා ගැනීම
- ★ ..............................................................

ආනයන ක්‍රියාපටිපාටියට අනුව ඊළඟ පියවර වන්නේ,
(1) ඉන්ඩෙන්ටුව ලැබීම
(2) ඉන්ඩෙන්ටුව විදේශ අපනයනකරුවන්ට යැවීම
(3) විදේශ ගැනුම්කරුවන් සොයා ගැනීම
(4) භාණ්ඩ නැව්ගත කර නෞභාර පත්‍රයක් ලබා ගැනීම
(5) මිල කියුමක් යැවීම

14. ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු වන නොයෙල්රාජ් තම සාර්ථකත්වයට බලපෑ හේතු කිහිපයක් මෙසේ ප්‍රකාශ කරයි.
- වර්ෂය අවසානයේ ලබා ගත යුතු අරමුණු හා ඒවා සාක්ෂාත් කර ගැනීමට ගත යුතු ක්‍රියා මාර්ග වර්ෂය ආරම්භයේ දී ම තීරණය කරනවා.
- තීරණය කරන ලද අරමුණු කරා ළඟා වෙනවා ද යන්න සොයා බලා ඒවාට ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමත් නො පමාව සිදු කරනවා

ඉහත ව්‍යාපාරිකයා ගනු ලබන ක්‍රියාමාර්ගවලට අදාළ කළමනාකරණ ශ්‍රිත අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය කුමක් ද ?
(1) පාලනය හා සැලසුම් කිරීම යි
(2) පාලනය හා සංවිධානය කිරීම යි
(3) මෙහෙයවීම හා පාලනය යි
(4) සංවිධානය කිරීම හා සැලසුම් කිරීම යි
(5) සැලසුම්කරණය හා පාලනය යි

15. කළමනාකරණය, පුද්ගලයාගේ මෙන් ම සංවිධානවල පරමාර්ථ සාධනය සඳහා අත්‍යවශ්‍ය වේ. සංවිධානවල පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා කළමනාකරණය විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ග පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වනුයේ,
(1) විකුණුම් උපරිම කිරීම / ගුණත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම / වෙළඳ පොළ පුළුල් කිරීම / සමාජ සුබසාධනය සැලසීම
(2) 10% කින් විකුණුම් වර්ධනය කිරීම / ගුණත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම / වෙළඳ පොළ පුළුල් කිරීම / සමාජ සුබසාධනය සැලසීම
(3) 10% කින් විකුණුම් වර්ධනය කිරීම / සේවකයන් 50 ක් පුහුණු කිරීම / දෙසැම්බර් මස දී නව යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම / සමාජ සුබසාධනය සැලසීම
(4) විකුණුම් වර්ධනය කිරීම / අතිරික්ත සේවකයන් 10 ක් ඉවත් කිරීම / සමාජ සුබසාධනය සැලසීම / වෙළඳ පොළ පුළුල් කිරීම
(5) විකුණුම් වර්ධනය කිරීම / අතිරික්ත සේවකයන් 10 ක් ඉවත් කිරීම / දෙසැම්බර් මස දී නව යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම / වෙළඳ පොළ කොටස 5% කින් පුළුල් කිරීම

16. හෙන්රි මින්ට්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකා හා උප භූමිකා සඳහා නිදසුන් කිහිපයක් පහත දැක් වේ.

| ප්‍රධාන භූමිකාව | උප භූමිකාව | භූමිකාව සඳහා නිදසුන් |
|---|---|---|
| 1. අන්තර් පුද්ගල භූමිකාව | A. ප්‍රකාශකයා | p. රැස්වීම්වල මුලසුන හෙබ වීම |
| 2. තොරතුරු භූමිකාව | B. ආයතන ප්‍රධානියා | q. අය වැය සකස් කිරීම |
| 3. තීරණ භූමිකාව | C. සම්පත් වෙන් කරන්නා | r. මාධ්‍යයට තොරතුරු සැපයීම |

ප්‍රධාන භූමිකාව, උප භූමිකාව යන භූමිකා සඳහා නිදසුන් අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර වනුයේ,
(1) 1Bp / 2Cr / 3Aq
(2) 1Aq / 2Cr / 3Bp
(3) 1Ar / 2Bp / 3Cq
(4) 1Cp / 2Bq / 3Ar
(5) 1Bp / 2Ar / 3Cq

17. සීමාසහිත රතු අරලිය සමාගමේ ප්‍රගති සමාලෝචන රැස්වීම අමතා ප්‍රධාන විධායක නිලධාරියා විසින් කළ කථාවේ උපුටනයක් පහත දැක් වේ.
''පසුගිය වර්ෂයේ අපේ ලාභය වුයේ (A) 4% ක් පමණයි. ඒත් අපි බලාපොරොත්තු වුණ ලාභය (B) 10% ක්. අපි (C) මේ සඳහා ගන්න ඕන ක්‍රියාමාර්ග තීරණය කරන්නට නම් ලාභය අඩු වීමට (D) හේතු හොයා බලන්න වෙනවා.''
ඉහත අංක (A), (B), (C), (D) යන ඉංග්‍රීසි අක්ෂර සඳහා අදාළ වන පාලන ක්‍රියාවලියේ පියවර දැක්වෙන පිළිතුර කුමක් ද ?
(1) (A) ප්‍රමිති ස්ථාපිත කිරීම / (B) විචලන හඳුනා ගැනීම / (C) ප්‍රතිකර්මීය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම / (D) කාර්යඵල මැනීම
(2) (A) කාර්යඵල මැනීම / (B) ප්‍රමිති ස්ථාපිත කිරීම / (C) ප්‍රතිකර්මීය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම / (D) විචලන හඳුනා ගැනීම
(3) (A) කාර්යඵල මැනීම / (B) ප්‍රමිති ස්ථාපිත කිරීම / (C) විචලන හඳුනා ගැනීම / (D) ප්‍රතිකර්මීය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම
(4) (A) විචලන හඳුනා ගැනීම / (B) ප්‍රමිති ස්ථාපිත කිරීම / (C) කාර්යඵල මැනීම / (D) ප්‍රතිකර්මීය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම
(5) (A) ප්‍රමිති ස්ථාපිත කිරීම / (B) කාර්යඵල මැනීම / (C) විචලන හඳුනා ගැනීම / (D) ප්‍රතිකර්මීය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

18. ''පෝෂිකා'' සේවය කරන ක්ෂණික නූඩ්ල්ස් නිෂ්පාදන ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය යන්ත්‍රාගාර, යන්ත්‍ර සූත්‍ර, අමුද්‍රව්‍ය, ශ්‍රමය යනාදිය තීරණය කිරීම සඳහා සිය කළමනාකරණ කණ්ඩායම සමග සාකච්ඡා කරයි. පෝෂිකාගේ මෙම ක්‍රියාවලිය මෙහෙයුම් කළමනාකරණයේ කුමන කාර්ය යටතට අයත් වන්නේ ද ?
(1) ද්‍රව්‍ය මිල දී ගැනීම
(2) නිෂ්පාදන සැලසුම්කරණය
(3) නිෂ්පාදන ඉංජිනේරුකරණය
(4) නිෂ්පාදන පාලනය
(5) පර්යේෂණ හා සංවර්ධනය

19. "නිෂ්පාදිතයේ ගුණත්වය" යන්න පැහැදිලි කිරීමක දී ව්‍යාපාර අධ්‍යයන ගුරුතුමිය විසින් අසන ලද ප්‍රශ්නවලට පන්තියේ සිසුන් 5 දෙනෙකු විසින් දෙන ලද පිළිතුරු පහත දැක් වේ.
(1) පිනිදු : පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීමේ දී තරගයට සාර්ථක ව මුහුණ දීමට හැකි භාණ්ඩ හා සේවා නිපදවීමයි
(2) තරිදු : පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමට භාණ්ඩයකට හෝ සේවාවකට ඇති හැකියාවයි
(3) දුමිදු : හානිවීම් හා පලුදුවීම් අඩු කර ගනිමින් නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා වේ
(4) පුබුදු : පාරිභෝගිකයාට සාධාරණ මිලක් ලැබෙන පරිදි හා ලාභදායකත්වය වර්ධනය වන අයුරින් භාණ්ඩ හා සේවා නිපදවීමයි
(5) ගෙවිදු : ආයතනයේ සමස්ත පිරිවැය අවම වන පරිදි නීතිමය තත්ත්වයන්ට අනුකූල ව භාණ්ඩ හා සේවාවන් නිපදවීමයි
ඉහත පිළිතුරු අතුරෙන් වඩාත් නිවැරදි පිළිතුර වනුයේ,
(1) පිනිදු
(2) දුමිදු
(3) පුබුදු
(4) තරිදු
(5) ගෙවිදු

20. චීනයේ කිංඩාඕ (King Da O) හා සෙයියෝ එක්ස්ප්ලෝරා (Xtiyo Explorer) යන පොහොර නිෂ්පාදන ව්‍යාපාර දෙකේ ඵලදායීතාව සම්බන්ධ තොරතුරු පහත වගුවේ දැක් වේ.

| ඵලදායීතාව | කිංඩාඕ | සෙයියෝ | යෙදවුම් ඒකක | |
|---|---|---|---|---|
| | | | කිංඩාඕ | සෙයියෝ |
| පූර්ණ ඵලදායීතාව | 2.5 | 3.0 | A | 4000 |
| ද්‍රව්‍ය ඵලදායීතාව | 5.0 | 6.0 | 2000 | B |
| යන්ත්‍ර ඵලදායීතාව | 10.0 | 12.0 | C | 1000 |
| ශ්‍රම ඵලදායීතාව | 10.0 | 12.0 | 1000 | D |

කිංඩාඕ ව්‍යාපාරයේ හා සෙයියෝ ව්‍යාපාරයේ නිමැවුම පිළිවෙළින් ඒකක 10000 ක් හා 12000 ක් නම් ඉහත වගුවේ A, B, C, D යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදවුම් ඒකක සංඛ්‍යාව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) 1000, 2000, 1000, 1000
(2) 4000, 2000, 1000, 1000
(3) 2000, 4000, 1000, 1000
(4) 4000, 1000, 2000, 1000
(5) 4000, 1000, 1000, 2000

[ හයවැනි පිටුව බලන්න

21. පහත වගුවේ අලෙවිකරණ හර සංකල්ප කිහිපයක් සහ එම අලෙවිකරණ හර සංකල්පවල අදහස ද ඉදිරිපත් කර ඇත.

| අලෙවිකරණ හර සංකල්ප | අදහස |
|---|---|
| (i) පිහිටුවීම<br>(ii) පිරිනැමුම්<br>(iii) අලෙවිකරණ මාර්ග<br>(iv) හැඟීම<br>(v) තරඟකාරිත්වය | A - ඉලක්ක වෙළඳ පොළ වෙත ළඟා වීමට අලෙවිකරුවෝ යොදා ගන්නා විවිධ ප්‍රවේශ<br>B - විභව හා පවතින සමජාතීය නිෂ්පාදිත සහ ආදේශකයන් මඟින් ඇති කරනු ලබන බලපෑම<br>C - සන්නිවේදන මාධ්‍ය අතරින් තමා භාවිත කරන සන්නිවේදන මාධ්‍ය කොතරම් විෂය පථයක් ආවරණය කරනවා ද යන්න පිළිබඳ ව්‍යාපාරිකයාගේ දෘෂ්ටිය<br>D - කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳව පාරිභෝගිකයාගේ මනසෙහි යහපත් ආකල්පයක් ගොඩ නැගීම<br>E - ව්‍යාපාරිකයන් විසින් ගනුදෙනුකරුවෙකුගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන වටිනාකම් සමූහය |

ඉහත වගුවේ අලෙවිකරණ හර සංකල්ප අනුපිළිවෙළ අනුව අදහස නිවැරදි ව ගැළපු විට ලැබෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) D, E, A, C, B (2) A, C, B, E, D
(3) C, E, A, D, B (4) D, E, C, B, A
(5) E, B, C, A, D

22. **යොහානිට** හා **සතිශාන්ට** ලැබුණු ආරාධනයක් පරිදි **නෙලුම් පොකුණ රඟහලෙහි** පැවැත්වෙන **සංගීත ප්‍රසංගයක්** සඳහා ඔවුන් පැමිණි අතර, එය නැරඹීමට මියුරු **අන්තර්ජාලය** හරහා ප්‍රවේශපත් ඇණවුම් කොට, **දුම්රියෙන්** පැමිණෙන විට බොහො කල් වේලා ඉක්ම ගොස් තිබිණි.

ඉහත සිද්ධිය තුළ තද කළු පැහැති අක්ෂරවලින් සඳහන් වන නිෂ්පාදිත පිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද ?

(1) පුද්ගලයින්, සේවා, ඉසව්, තොරතුරු, ස්ථාන (2) පුද්ගලයින්, ඉසව්, ස්ථාන, තොරතුරු, සේවා
(3) පුද්ගලයින්, ස්ථාන, ඉසව්, සේවා, තොරතුරු (4) පුද්ගලයින්, ස්ථාන, ඉසව්, තොරතුරු, සේවා
(5) පුද්ගලයින්, සේවා, ඉසව්, තොරතුරු, ස්ථාන

23. අලෙවිකරණ මිශ්‍රයට ඇතුළත් කළ හැකි සාධක කිහිපයක් පහත දක්වා ඇත.

A - ගුණත්වය B - ප්‍රදේශය C - ආවරණය D - දීමනා
E - වගකීම F - ප්‍රචාරණය G - සෘජු අලෙවිකරණය H - ප්‍රවාහනය
I - ඇසුරුම J - අංග K - තොග L - ණය කොන්දේසි
M - පෞද්ගලික අලෙවිය N - ගෙවීම් කාලය

ඉහත සාධකවල ඉංග්‍රීසි අක්ෂර අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් යටතේ නිවැරදි ව ඇතුළත් කර ඇති වරණය තෝරන්න.

| | නිෂ්පාදිතය | මිල | ස්ථානය | ප්‍රවර්ධනය |
|---|---|---|---|---|
| (1) | DLNI | ABC | EFGH | JKM |
| (2) | CEGM | ABD | FHIJK | LKN |
| (3) | BCIJ | FHK | GLMN | ADE |
| (4) | AEIJ | DLN | BCHK | FGM |
| (5) | AEIG | DLN | KNML | CBF |

24. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක විවිධ අරමුදල් සම්පාදන මාර්ගයන් ය.

A - කොටස් නිකුතුව
B - ණයකර නිකුතුව
C - රඳවා ගත් ලාභ
D - ක්ෂය වෙන් කිරීම
E - වාණිජ පත්‍රිකා
F - බැංකු අයිරා

මෙම අරමුදල් සම්පාදන මාර්ග අතුරෙන් දිගු කාලීන සෘජු අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග හා දිගු කාලීන සෘජු බාහිර මූල්‍ය සම්පාදන මාර්ග පිළිවෙළින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) C,D හා A,B (2) A,B හා E,F (3) A,B හා C,D
(4) C,D හා E,F (5) E,F හා C,D

[ හත්වැනි පිටුව බලන්න

25. මූල්‍ය වෙළඳ පොළ කාර්ය කිහිපයක් පහත දක් වේ.

A - වාණිජ බැංකුවක් තවත් වාණිජ බැංකුවකින් දින තුනකින් පියවීමට ණයක් ගැනීම
B - අපනයනකරුවන් ලබා ගන්නා විදේශ මුදල් වාණිජ බැංකුවකට විකුණා ශ්‍රී ලංකා රුපියල් ලබා ගැනීම
C - ආයෝජකයන් භාණ්ඩාගාර බැඳුම්කර මිල දී ගැනීම
D - ආයෝජකයන් තමා මිල දී ගත් කොටස් ද්විතීයික වෙළඳ පොළේ අලෙවි කිරීම
E - රාජ්‍ය සංස්ථාවලට අරමුදල් සපයා ගැනීම සඳහා ණයකර නිකුත් කිරීම

ඉහත කාර්ය අතරින් පිළිවෙළින් මුදල් වෙළඳ පොළට හා ප්‍රාග්ධන වෙළඳ පොළට අයත් කාර්ය නිවැරදි ව දක්වෙන පිළිතුර වන්නේ,

(1) A,D හා B,C,E ය (2) A,B හා C,D,E ය (3) A,B,C හා D,E ය
(4) C,D,E හා A,B ය (5) B,C හා A,D,E ය

26. පහත දක්වෙන්නේ මානව සම්පත් කළමනාකරණයට අදාළ සංකල්ප කිහිපයක අර්ථ දැක්වීමකි.

A - යම් නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීම සඳහා ආයතනයේ වැඩ ඒකකයක් වශයෙන් කළ යුතු කාර්යන්, රාජකාරි හා වගකීම් සකස් කිරීම රැකියා විශ්ලේෂණය යි
B - රැකියාවක ලක්ෂණ හා අදාළ චර්යාවන් පිළිබඳවත්, එම රැකියාව සාර්ථක ලෙස ඉටු කිරීමට සේවකයා සතු විය යුතු ගුණාංග පිළිබඳ කරනු ලබන ක්‍රමානුකූල විමර්ශනය රැකියා නිර්මාණය යි
C - කිසියම් රැකියාවකට අයත් කටයුතු, රාජකාරි, වගකීම්, සේවා කොන්දේසි විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා විස්තරය යි
D - රැකියාවක් ඉටු කිරීමට රැකියාව දරන්නා සතු විය යුතු සුදුසුකම් ඇතුළත් කර සකස් කරන ලද ලියවිල්ල රැකියා පිරිවිතරය යි
E - ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම පිණිස අනාගත සේවක අවශ්‍යතා නිශ්චය කිරීම හා ඒ අවශ්‍යතා ඉටු කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීම මානව සම්පත් සැලසුම්කරණය යි

ඉහත අර්ථ දැක්වීම්වලින්,

(1) A,B,E සත්‍ය වන අතර C,D අසත්‍ය වේ (2) A,B,C සත්‍ය වන අතර D,E අසත්‍ය වේ
(3) A,C,E සත්‍ය වන අතර B,D අසත්‍ය වේ (4) A,B,D සත්‍ය වන අතර C,E අසත්‍ය වේ
(5) C,D,E සත්‍ය වන අතර A,B අසත්‍ය වේ

27. ලිප්ටන් වටරවුමේ, කොටුව දුම්රිය පොළ ඉදිරිපිට සහ රජයේ ආයතන ඉදිරිපිට විවිධ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග දැකිය හැකිය. එවැනි ක්‍රියාමාර්ගයක් වන ප්‍රතිභාහනය (Picketing) යනුවෙන් අදහස් වන්නේ,

(1) සිය ඉල්ලීම් දිනා ගැනීම සඳහා ව්‍යාපාර ස්ථානය ඉදිරිපිට හෝ පොදු ජනතාව ගැවසෙන ස්ථානයක පෙනී සිටිමින් සේවක පිරිසක් ආහාර පාන ගැනීමෙන් වැළකී විරෝධය දැක්වීම යි
(2) රැකියා ස්ථානයේ ඇති යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට නොහැකි ලෙස දොරගුළු දමා වසා තැබීම හෝ ඒවායේ සුළු කොටසක් ගලවා තැබීම යි
(3) සේවකයන්ගේ සාමාන්‍ය රාජකාරී සේවා කාලයෙන් පසු වැඩ කිරීම ප්‍රතික්ෂේප කිරීම යි
(4) බොහෝ විට දිවා ආහාර විවේකය වැනි විවේක අවස්ථාවක් යොදාගෙන සේවකයන් ව්‍යාපාරය ඉදිරිපිට (පරිශ්‍රය තුළ) පෝස්ටර්, දැන්වීම්, බැනර් වැනි විරෝධය ප්‍රකාශ කරන පුවරු ප්‍රදර්ශනය කරමින් සිදු කරනු ලබන සාමකාමී උද්ඝෝෂණය යි
(5) වෘත්තීය ගැටලුවක් සම්බන්ධයෙන් එකඟතාවයකට පත්වීම සඳහා සේව්‍ය පක්ෂය හා වෘත්තීය සමිති නියෝජිතයන් අතර අදහස් හුවමාරු කර ගැනීම යි

28. A ආයතනයේ ශ්‍රම පිරිවැටුම B ආයතනයේ ශ්‍රම පිරිවැටුමට වඩා පහළ මට්ටමක පවතින බව අනාවරණය විය. A ආයතනය පිළිබඳ ව ගත හැකි නිගමනය වනුයේ,

(1) A ආයතනයේ මානව සම්පත් කළමනාකරණය කාර්යක්ෂම බව ය
(2) A ආයතනයේ මානව සම්පත් කළමනාකරණය අකාර්යක්ෂම බව ය
(3) A ආයතනයේ මනා සේව්‍ය - සේවක සබඳතාවක් නොපවතින බව ය
(4) A ආයතනයේ සේවකයින් ඉවත් වී යාම වැඩි බව ය
(5) A ආයතනයේ සේවකයින් ඉවත් ව යාම අඩු බව ය

29. කාර්යාල ස්වයංක්‍රීය පද්ධති (Office automation System) ව්‍යාපාරයක දත්ත සේවකයන්ගේ සහ කාර්යාලවල ඵලදායකත්වය වැඩි කිරීම සඳහා භාවිත කරන තොරතුරු පද්ධති වේ. මෙම පද්ධති සඳහා උදාහරණයක් නොවන වරණය තෝරන්න.
(1) දත්ත සමුදාය පද්ධති (Data Base System)
(2) වදන් සැකසුම් පද්ධති (Word Processing System)
(3) පරිගණක ආශ්‍රිත සැලසුම්කරණ පද්ධති (Computer Aided Designing System)
(4) පරිගණක අක්ෂර සංයෝජන පද්ධති (Desktop Publishing System)
(5) විද්‍යුත් තැපැල් මෙහෙයුම් පද්ධති (Electronic Mail System)

30. පහත වගුවේ තොරතුරු වර්ගීකරණය සිදු කරන ආකාර කිහිපයක් සහ තොරතුරු වර්ග කිරීමේ නිර්ණායක කිහිපයක් දක්වා ඇත.

| නිර්ණායක | තොරතුරු වර්ගීකරණය |
|---|---|
| (i) මූලාශ්‍ර අනුව | A - නියත, සම්භාවිතාත්මක |
| (ii) ස්වභාවය අනුව | B - අතීත, වර්තමාන, අනාගත |
| (iii) කාලය අනුව | C - මූල්‍ය, මෙහෙයුම්, මානව, අලෙවි |
| (iv) සම්භාවිතාව අනුව | D - බාහිර, අභ්‍යන්තර |
| (v) ව්‍යාපාර ශ්‍රිත අනුව | E - ප්‍රමාණාත්මක, ගුණාත්මක |

ඉහත වගුවේ දක්වා ඇති නිර්ණායක අනුපිළිවෙළ අනුව වර්ගීකරණය නිවැරදි ව දක්වා ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) A,B,C,D,E (2) D,E,B,C,A (3) D,E,B,A,C
(4) B,E,C, A,D (5) B,E,D,C,A

✷ **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

**31. (අ) ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය තුළ දී ............. නිෂ්පාදනය සිදු වූ අතර ඒ තුළින් ....................................... ඇති විය.**

**(ආ) මාර්ග අනතුරු අවම කිරීමේ අරමුණින් පදික මාරුව සඳහා යොදා ඇති කහ ඉරි වෙනුවට සුදු ඉරි යෙදීමට නිර්දේශ කළ රාජ්‍ය ආයතනය .......................................................................................... වන අතර මිල පාලනයට යටත් භාණ්ඩ වැඩි මිලට විකිණීම සහ සඟවා තැබීම වැනි වෙළෙඳ විෂමාචාර සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි විභාග කිරීමට බලතල ඇති ආයතනය ............................................ වේ.**

**32. (අ) ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් අධීක්ෂණය කිරීම හා විධිමත් කිරීම සඳහා කටයුතු කරන ආයතනය ........................................................................................... වන අතර රාජ්‍ය සේවකයින් සඳහා අග්‍රහාර රක්ෂණය ක්‍රියාවට නංවන ආයතනය වනුයේ .................................................... යි.**

**(ආ) පාසල් සිසුන් සඳහා ක්‍රියාත්මක රක්ෂණාවරණය ...................................... වන අතර එය .............................................. යන රක්ෂණ ආයතනය ක්‍රියාවට නංවයි.**

**33. (අ) වෙළඳ ආයතන ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළෙඳ ණය අය කිරීම සහ ණය මිල දී ගැනීම සිදු කරනු ලබන ආයතන .............................. ලෙස හැඳින්වෙන අතර බැංකුවකට හා මූල්‍ය ආයතනයකට ණය ඉල්ලුම්කරුවකු පිළිබඳව ඇගයීමක් සඳහා නිවැරදි තොරතුරු ලබාගත හැකි ආයතනයක් වනුයේ ......................................................................................... යි.**

(ආ) නවීනතම තාක්ෂණය මත පදනම් වූ ලොව පුරා මූල්‍ය වෙළඳ පොළවල් ආවරණය කෙරෙන සන්නිවේදන ජාලය ............................................................................. ක්‍රමය ලෙස සැලකෙන අතර පරිගණක භාවිත කරමින් බැංකු අතර සිදුවන සුළු ගනුදෙනු පියවීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමයක ........................................................................................................ යි.

**34.** (අ) ආයතනයකට සංවිධාන සටහන ඉදිරිපත් කළ හැකි ආකාර වනුයේ (1) සිරස් සංවිධාන සටහන (2) ............................................ සහ (3) ............................................. යි.

(ආ) සංවිධානයක සමස්තය දැකීම හා සමෝධානය කිරීමේ හැකියාව ............................................. කුසලතා ලෙස හඳුන්වන අතර කිසියම් විශේෂිත ක්ෂේත්‍රයකට අදාළ ව යම් කාර්යයක් කිරීමට ඇති හැකියාව ............................................ කුසලතාවට අයත් වේ.

**35.** (අ) ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සැපයීමට උපකාරීවන යටිතල පහසුකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමත් භාණ්ඩ හා ද්‍රව්‍ය මුල් ස්ථානයේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා ගෙන යාමත් ............................ ලෙස හඳුනාගත හැකි අතර නිෂ්පාදිත නිර්මාණය කිරීමටත්, නිෂ්පාදන ක්‍රියාවලිය කළමනාකරණයටත් පරිගණක යොදා ගැනීම ....................................................................... ලෙස හැඳින්වේ.

(ආ) බේකරි නිෂ්පාදිත වර්ග සඳහා ...................................... නිෂ්පාදන ක්‍රමය ද මෝටර් රථ නිෂ්පාදනය සඳහා ......................................... නිෂ්පාදන ක්‍රමය ද වඩාත් යෝග්‍ය වේ.

**36.** (අ) ආයතනයේ ප්‍රතිරූපය හෝ එහි නිෂ්පාදිතය ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීම සඳහා සැලසුම් කර ඇති විවිධ වැඩසටහන් ............................................... ලෙස ද ගනුදෙනුකරුවන් සමඟ පෞද්ගලික ව මුහුණට මුහුණලා අදහස් හුවමාරු කර ගනිමින් මනා සම්බන්ධතා ගොඩනඟා නිෂ්පාදිත අලෙවි කිරීමේ ප්‍රවර්ධන ක්‍රමය .................................................... ලෙස ද හැඳින්වේ.

(ආ) ව්‍යාපාර ආයතනයේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන අලෙවිකරණ උපාය මාර්ග සමූහය .................................................... යනුවෙන් හඳුන්වන අතර ආයතනයක් වෙළඳ පොළට ඉදිරිපත් කරන සමස්ත භාණ්ඩ හා සේවා පැස .................................................... ලෙස හඳුන්වයි.

**37.** (අ) යම් කාලයක් තුළ සේවකයින් ආයතනයෙන් ඉවත් ව යාමේ ශීඝ්‍රතාව ............................................ නම් වන අතර සේවකයන් සේවයට නොපැමිණීම නිසා ආයතනයට සේවය අහිමි වී යාම ........................................ ලෙස හැඳින්වේ.

(ආ) කිසියම් පරිශ්‍රමිකයක් මත යම් පුද්ගලයෙකු, පුද්ගල කණ්ඩායමක් යම් සේවයක නිරත කරවන්නන් .................................. ලෙස හැඳින්වෙන අතර සේවකයන් වෙත පැවරෙන කාර්ය යථා පරිදි ඉටු කිරීම සඳහා සේවා ගිවිසුම් හා අණ පනත් යනාදියෙන් ඔවුනට ලැබෙන වරප්‍රසාද ...................................................... ලෙස හැඳින්වේ.

**38.** (අ) කොළඹ කොටස් හුවමාරුවෙහි කිසියම් ලැයිස්තුගත සමාගමක කොටස්, මූල්‍ය ශක්තිය, .......................... හා .................................................. යන නිර්ණායක සපුරන්නේ නම් පමණක් ඒවා S&P SL20 දර්ශකයට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබයි.

(ආ) ...................................... මිල දර්ශකය 2004 වර්ෂයේ දෙසැම්බර් 17 යන දින කොටස් වෙළඳ පොළට හඳුන්වා දෙන ලද අතර එහි පාද අගය .......................... යි.

**39.** (අ) සමාන රුචි අරුචි කම් ඇති කණ්ඩායම්වලට තොරතුරු ලබා ගැනීමට හා අදහස් හුවමාරු කර ගැනීමට සපයන පහසුකමක් ලෙස ................................................ සැලකිය හැකි අතර එක් ස්ථානයක ඇති පරිගණකයක සිට අන්තර්ජාලය මගින් තවත් ස්ථානයක ඇති පරිගණකයක් භාවිත කිරීමට පහසුකම් සැලසීම ............................................. සේවය ලෙස සැලකිය හැකිය.

(ආ) භූගෝලීය ව්‍යාප්තිය අනුව පරිගණක ජාල (1) ................................................................. හා (2) .................................................... ලෙස වර්ග කළ හැකිය

**40.** දළ ලාභයෙන් .................................................. සහ .................................................. අඩු කිරීමෙන් ක්‍රියාකාරී ලාභය ලැබෙන අතර ඉන් ...................... සහ ...................... අඩු කිරීමෙන් බදු පෙර ශුද්ධ ලාභය ලබාගත හැක.

✷ **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

**41.** ව්‍යාපාරයක් විසින් ලබා ගන්නා සෘජු සේවා හතරක් ලියන්න.
1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................

**42.** ගෝලීය පරිසරයට අයත් ප්‍රධාන බලවේග හතරක් ලියන්න.
1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................

**43.** සීමිත පොදු සමාගම් ක්‍රමයේ ඔබ දකින වාසි හතරක් සඳහන් කරන්න.
1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................

**44.** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ශක්තීන් හතරක් ලියන්න.
1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................

**45.** මධ්‍යගතකරණය මගින් සංවිධානයකට අත්විය හැකි අවාසි හතරක් සඳහන් කරන්න.
1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................

**46.** ප්‍රවර්ධනය සඳහා ව්‍යාපාර විසින් සංවිධානය කරන විවිධ ඉසව් හතරක් ලියන්න.
1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. ..................................................................................................................................

**47.** ආයතනයක සේවකයින්ගේ සේවා නියුක්තියේ ඇතිවන වෙනස්කම් සිදු කළ හැකි ක්‍රම හතරක් ලියන්න.

1. ..................................................
2. ..................................................
3. ..................................................
4. ..................................................

**48.** දත්ත පිහිටන ආකාර හතරක් ලියන්න.

1. ..................................................
2. ..................................................
3. ..................................................
4. ..................................................

**49.** ව්‍යාපාර සැලැස්මක ශක්‍යතාව ඇගයීමේ දී භාවිත කරන මූල්‍ය හා මූල්‍ය නොවන මිණුම් දඬු දෙක බැගින් පහත වගුව තුළ ලියන්න.

| මූල්‍ය මිණුම් දඬු | මූල්‍ය නොවන මිණුම් දඬු |
|---|---|
| 1. .......................... | 1. .......................... |
| 2. .......................... | 2. .......................... |

**50.** පහත සඳහන් කෙටි දුරකථන අංකවලින් ලබාගත හැකි සහාය සේවාව ඒ ඉදිරියෙන් ලියන්න.

1. **1929** : ..................................................
2. **1990** : ..................................................
3. **1919** : ..................................................
4. **1911** : ..................................................

සැකසුම : බණ්ඩාර දිසානායක.
B.Sc.(Mgt) Sp.

[F: \ backup of D \ ILSL \ My Documens \ MCQ 2021 November indd (07.11.2021]